*සැ. යු.* - 2012.08.17 වැනි දින පළවූ අංක 1,772 දරන *ගැසට් පත්‍රයේ* I : III සහ II කොටස් පළ නොවීය.
මෙවර පළවන *ගැසට් පත්‍රයේ* V කොටසේ 2008 වර්ෂයේ ඔක්තෝබර්-දෙසැම්බර් කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,773 - 2012 අගෝස්තු මස 24 වැනි සිකුරාදා - 2012.08.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 800 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 801 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 805 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 807 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 සැප්තැම්බර් මස 14 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 අගෝස්තු මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*).

2012 ජුනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

D1284/DISC (Ay).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2009 මැයි මස 31 වැනි දින සිට අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්) දොන් චන්දන ප්‍රියන්ත රූපසිංහ, ආර්එස්පී යූඑස්පී පීඑස්සී (නි/60006)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 ජූලි මස 29 වැනි දින,
කොළඹ දී ය.

08-602

---

2012 අංක 589

MOD/DEF/02/01/ARF/RF/137.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2012 මාර්තු මස 31 වැනි දින සිට ලුතිතන් කර්නල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික ලුතිතන් කර්නල් මදුරප්පෙරුම ආරච්චිගේ දීප්ති අල්විස් විජයගුණරත්න, ආර්එස්පී කරෙ (නි/61813)

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2012 අප්‍රේල් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් කර්නල් මදුරප්පෙරුම ආරච්චිගේ දීප්ති අල්විස් විජයගුණරත්න ආර්එස්පී කරෙ (නි/61813)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 අප්‍රේල් මස 07 වැනි දින,
කොළඹ දී ය.

08-603

---

2012 අංක 590

DRF/RECT/495.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අන්තර් රෙජිමේන්තු මාරු කිරීමක්

පහත නම සඳහන් නිලධාරී 2011 ජූලි මස 4 වැනි දින සිට යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව වෙතින් ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති රෙජිමේන්තුව වෙත මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික ලුතිතන් කර්නල් හොරණ පතිරණගේ ඉන්දික පෙරේරා - ගජබා රෙජිමේන්තුව

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2011 අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

08-740

---

2012 අංක 591

MOD/DEF/2/01/ARF/RE.M/99.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරී 2011 නොවැම්බර් මස 15 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් දුග්ගන්නා රාලලාගෙදර අජිත් ප්‍රසන්න කුමාර, ගැහේබ (නි/65018)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2011 නොවැම්බර් මස 16 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් දුග්ගන්නා රාලලාගෙදර අජිත් ප්‍රසන්න කුමාර, ගැහේබ (නි/65018)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 මාර්තු මස 16 වැනි දින,
කොළඹ දී ය.

08-738

---

2012 අංක 592

MOD/DEF/02/01/ARF/REM/135.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2012 පෙබරවාරි මස 10 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් අශෝක කුමාර අබේනන්ද, ශ්‍රීලපාහ (නි/65392)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2012 පෙබරවාරි මස 11 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් අශෝක කුමාර අබේනන්ද, ශ්‍රීලපාහ (නි/65392)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 අප්‍රේල් මස 07 වැනි දින,
කොළඹ දී ය.

08-674

---

2012 අංක 593

MOD/DEF/02/01/ARF/RF/157.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2012 අගෝස්තු මස 23 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් (උපකරණ පාලක) නීල් සංජීව සුමිත්‍ර ආරච්චි, ශ්‍රීලංසිරෙ (නි/67551)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 මැයි මස 15 වැනි දින,
කොළඹ දී ය.

08-739

---

2012 අංක 594

MOD/DEF/2/01/ARF/RFS/56.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරිණී 2011 නොවැම්බර් මස 01 වැනි දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් මතෙස් ආරච්චිගේ නිම්මි තරංගා සුරේෂ්නි ශ්‍රීලයුවෛබ (නි/67095)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

08-673

MOD/DEF/2/01/ARF/CW/108.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් නියම කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් පහත නම සඳහන් නිලධාරිණී 2011 ඔක්තෝබර් මස 17 වැනි දින සිට අධිකාරියෙන් ඉවත් කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් නියම කර ඇත.

දෙවන ලුතිතන් රත්නායක මුදියන්සේලාගේ නිරෝෂා ගීතානි රත්නායක, සබුබ (නි/65162)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 මාර්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

08-741

---

2012 අංක 595

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර එයාර් වයිෂ් මාර්ෂල් නිලයට උසස් කෙරේ.

තාවකාලික එයාර් වයිෂ් මාර්ෂල් පතිරන්නැහේලාගේ දොන් ජයනාත් කුමාරසිරි (01322) කාර්මික/ඉංජී 2012.03.01
තාවකාලික එයාර් වයිෂ් මාර්ෂල් බාලසූරිය ලේකම්ලාගේ වසන්ත බාලසූරිය (01320) කාර්මික/ඉංජී 2012.03.02
තාවකාලික එයාර් වයිෂ් මාර්ෂල් කැටගොඩගේ දොන් උපාලි චන්ද්‍රතිලක (01321) කාර්මික/ඉංජී 2012.03.03

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 අප්‍රේල් මස 17 වැනි දින,
කොළඹ දී ය.

08-638

---

2012 අංක 596

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර එයාර් කොමදෝරු නිලයට උසස් කෙරේ.

තාවකාලික එයාර් කොමදෝරු රොහාන් පැට්‍රික් ටෙරන්ස් කොරයා (01403) පරිපාලන - 2012.04.01

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 අප්‍රේල් මස 07 වැනි දින,
කොළඹ දී ය.

08-635

---

2012 අංක 597

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර එයාර් කොමදෝරු නිලයට උසස් කෙරේ.

තාවකාලික එයාර් කොමදෝරු ජනක් ප්‍රසන්න වනිගතුංග (01416) විද්‍යුත්/කාර්මික 2012.03.01

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 මාර්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

08-636

2012 අංක 598

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර ගෲප් කැප්ටන් නිලයට උසස් කෙරේ.

තාවකාලික ගෲප් කැප්ටන් චන්දිමාල් හේමන්ත රන්සිරි සොයිසා (01693) පරිපාලන 2012.04.10

තාවකාලික ගෲප් කැප්ටන් හේරත් මුදියන්සේලාගේ බණ්ඩාර හේරත් (01604) ඉලෙක්ට්‍රෝ/ඉංජි 2012.05.11

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 අප්‍රේල් මස 07 වැනි දින,
කොළඹ දී ය.

08-670

---

2012 අංක 599

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔහුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික ගෲප් කැප්ටන් නිලයට උසස් කෙරේ.

විං කමාන්ඩර් චන්ද්‍රකුමාර ජයසිරි බටගොඩ (01707) පරිපා/රෙජිමේන්තුව 2012.01.02

විං කමාන්ඩර් කීර්ති වන්නිගම (01665) පරිපා/රෙජිමේන්තුව 2012.02.10

විං කමාන්ඩර් කටුකොහිල ගමගේ රන්ජිත් හේමචන්ද්‍ර (01721) පරිපා/රෙජිමේන්තුව 2012.03.13

විං කමාන්ඩර් රන්වගොඩ ගමගේ චන්දන දීප්ති රවිහංස (01580) පරිපා/රෙජිමේන්තුව 2012.03.14

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2012 අප්‍රේල් මස 18 වැනි දින,
කොළඹ දී ය.

08-637

---

2012 අංක 600

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි සිට තාවකාලික විං කමාන්ඩර් නිලයට උසස් කෙරේ.

ස්කොඩ්‍රන් ලීඩර් උතුවම් පතිරැන්නැහැලාගේ යාතක රොහාන් පතිරන (01888) පරිපා/රෙජිමේන්තුව 2012.01.02

ස්කොඩ්‍රන් ලීඩර් නදිජා හරින්ද්‍රනි වරාපිටිය (02230) පරිපා/නීති 2012.01.02

ස්කොඩ්‍රන් ලීඩර් විතාන කුරුප්පු අප්පුහාමිලාගේ සංජය විතාන (01964) පරිපා/රෙජිමේන්තුව 2012.01.03

ස්කොඩ්‍රන් ලීඩර් රසන්ති විත්‍රිකා පතිරන (ඕඩබ්/01019) පරිපාලන 2012.03.01

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 අප්‍රේල් මස 07 වැනි දින,
කොළඹ දී ය.

08-671

---

2012 අංක 601

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි සිට තාවකාලික විං කමාන්ඩර් නිලයට උසස් කෙරේ.

ස්කොඩ්‍රන් ලීඩර් උස්වත්ත ලියනගේ රොමේෂ් මේරියන් ඔල්බන් පෙරේරා (01927) පරිපාලන 2012.01.02

ස්කොඩ්‍රන් ලීඩර් නාලක යමින්ද රාහුල නුගේගොඩ (01960) පරිපාලන 2012.01.03

ස්කොඩ්‍රන් ලීඩර් වත්තගේ විපුල්සිරි සනත් ගුණතිලක (02035) පරිපාලන 2012.01.04

ස්කොඩ්‍රන් ලීඩර් නදුන් ආසිරි ගාල්ලගේ (02029) පරිපාලන 2012.01.11

ස්කොඩ්‍රන් ලීඩර් දූවගේ චින්තක ධනංජය බණ්ඩාර අල්විස් (01962) පරිපාලන 2012.01.19

ස්කොඩ්‍රන් ලීඩර් චතුර චින්තක මොරකන්ද ගමගේ (02039) කාර්/ඉංජිනේරු 2012.01.31

ස්කොඩ්රන් ලීඩර් අමරසිංහ ආරච්චිලාගේ සුසන්ත සනත් නන්දසිරි පීරිස් (02028) පරිපාලන 2012.02.02

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 අප්‍රේල් මස 07 වැනි දින,
කොළඹ දී ය.

08-672

---

2012 අංක 602

**ජාතික ශිෂ්‍යභට බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම්

(අ) 2012 අගෝස්තු මස 01 වැනි දින සිට තාවකාලික බ්‍රවේ කර්නල් වශයෙන්

නි/3023 ලුතිතන් කර්නල් කේපීපී චන්ද්‍රලතා (ගැ)
නි/3254 මේජර් ඒඩීඑම්ඩී බණ්ඩාර

(ආ) 2012 අගෝස්තු මස 01 වැනි දින සිට තාවකාලික බ්‍රවේ ලුතිතන් කර්නල් වශයෙන්

නි/3028 මේජර් බීඩීසී ජයවර්ධන
නි/3149 මේජර් ඩබ්ජ්එල්අයි වීරසිංහ (ගැ)
නි/3158 මේජර් එස්ජී හේවාවිතාරණ
නි/3255 මේජර් එස්සීජේ රූපසිංහ (ගැ)
නි/3442 මේජර් ආර්යුකේ රාජපක්ෂ
නි/3463 මේජර් ජීඑම්එස් පෙරේරා (ගැ)
නි/3627 මේජර් එල්ජීපීබී ලියන්ගස්කුඹුර

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 ජූලි මස 31 වැනි දින,
කොළඹ දී ය.

08-669

---

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2012 අංක 603

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ඒ. ඩබ්ලිව්. සෙනෙවිරත්න මහතා, 2012 ජනවාරි මස 27 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්

08-705/1

---

2012 අංක 604

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ජගත් පී. විජේවීර මහතා 2010 අගෝස්තු මස 18 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් වශයෙන්.

08-705/2

2012 අංක 605

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ එම්. පී. ඩී. යූ. කේ මාපා පතිරණ මහතා 2010 දෙසැම්බර් මස 01 වැනි දින ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

08-705/3

---

2012 අංක 606

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I වැනි පන්තියේ, පී. එම්. අනුර ද සිල්වා මහතා, 2012 ජූනි මස 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන්.

08-705/4

# රජයේ නිවේදන

අංකය RG/NB/11/02/15/2012 පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2012.08.24 වැනි දින සිට 2012.09.07 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2012.09.14 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී දරන කොට්ඨාසයේ 376 වෙළුමේ 93 පත් ඉරුව | දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, හික්කඩුව වවුලාගොඩ පිහිටි "මුදිල්ලගහවත්ත" ඉඩමෙන් බෙදාවෙන් කළ අංක 16 දරන කැබැල්ලට බලයලත් මානක එන්. එෆ්. ඩී. එස්. ඌරගොඩගේ මානක තැන විසින් 1949.08.15 වැනි දින මැන සාදන ලද අංක 392බී පිඹුර ප්‍රකාර මායිම්,<br><br>උතුරට : මෙම ඉඩමේ අංක 15 දරන කැබැල්ල<br>නැගෙනහිරට : මෙම ඉඩමේ අංක 17, 18, 19 දරන කැබලි<br>දකුණට : මෙම ඉඩමේ අංක 23 සහ 27 දරන කැබලි<br>බස්නාහිරට : මහ පාර සහ මෙම ඉඩමේ අංක 27 දරන කැබැල්ල.<br>ප්‍රමාණය : අක්. 0, රූ. 01, පර්. 13.10. | 01. ඒ. පී. පණ්ඩිත ගුණවර්ධන ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1989.05.10 දින අංක 278 දරන තෑගි ඔප්පුව. |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ 3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

08-605

---

**වන්දනා ගමන් ආඥාපනත**

සිත්තාන්ඩි ශ්‍රී චිත්තිරවේලායුද ස්වාමි කෝවිල් උත්සවය - 2012

යථෝක්ත උත්සවය 2012 අගෝස්තු මස 16 වැනි දින පටන්ගෙන 2012 අගෝස්තු මස 31 වැනි දින දක්වා පවත්වනු ලබන මෙම උත්සවයට වන්දනා සඳහා පැමිණෙන අයගේ සහ අනෙකුත් සියලු දෙනාගේ ම දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශ කරමි.

1948.07.16 වැනි දින අංක 9886 දරන ආණ්ඩුවේ ගැසට් නිවේදනයේ සඳහන් නිත්‍ය නියෝගයන් කෙරෙහි මෙම උත්සව සමයේ දී එහි උත්සවයට පැමිණෙන සියල්ලන්ගේ හා අනෙකුත් අයගේ අවධානය මෙයින් යොමු කරමි.

යූ. උදයශ්‍රීදර්,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
එරාවූර්පත්තු, සෙංකලඩි.

08-607

### 2012 බොල්තුඹේ සමන් දේවාලයේ ඇසල පෙරහැර

(i) 2012 වසරේ ඇසල පෙරහැර සඳහා කප් සිටුවීම ජූලි මස 16 වැනි දින අළුයම සුභ මොහොතින් සිදු කරන ලදී.

අගෝස්තු මස 15 වැනි දින සිට 26 වැනි දින දක්වා උඩ මළුවේ පෙරහැර ;
අගෝස්තු මස 27 වැනි දින සිට 31 වැනි දින දක්වා මහ පෙරහැර ;
සැප්තැම්බර් මස 01 වැනි දින වලහුන් ඇල්ල මූකලාන දිය උල්පතේ දී දිය කැපීමේ මංගල්‍යයෙන් අනතුරුව පෙරහැර ගෙවැදීමෙන් ඇසල පෙරහැර මංගල්‍ය නිමා කිරීමට නියමිතය.

(ii) දේවාලයේ උතුරට පාර එම්. කේ. ලුවිස් සිංඤෝ, එම්. කේ. පොඩිමහත්මයා යන අයගේ ඉඩමද, නැගෙනහිරට සිරිනිමල් හා එම්. කේ. විජේදාස යන අයගේ ඉඩම ද, දකුණට රංබණ්ඩාර මහතාගේ ඉඩම ද ගල්පඩිය වත්ත යන ඉඩම ද බස්නාහිරට බී. එම්. විජේහාමි හා නෝබට් චින්තාමනි යන අයගේ ඉඩම ද මායිම්ව පිහිටි භූමි භාගය වන්දනාකරුවන්ට ලැගුම් සඳහා පෙරහැර නැරඹීම සඳහා වෙන් කරමි.

(iii) විහාරමළුව බෝධිමළුව හා දේවාල භූමිය යන ස්ථාන අවට භූමි භාගවල ආහාර පිසීම තහනම් කරමි.

(iv) උඩමළුව තුළ දඩු හැල තුළ චෛත්‍යමළුව තුළ රටගෙයිමළුව තුල හා විහාර මළුව තුල සියලු වෙළදාම් තහනම් කරමි.

(v) පහල වීදියේ දකුණු පැත්තට ප්‍රධාන ගල්පඩිපෙළ සිට සිංහාසන මන්දිරය දක්වා ද, ගල්පඩිපෙළ නැගෙනහිර පැත්තෙන් නැටුම් කාමරය දක්වා ද, පහල වීදියේ දේවාලය දෙසට වන්නට රටගෙයි මළුව බැම්ම සිට චෛත්‍ය කොටස දක්වා ද, මා විසින් නියම කරන ලද භූමිය ද, නැවත රටගෙයිමළුවට නැගෙනහිරින් හා දකුණින් පහල කොටස ද, රටගෙයි ඉදිරිපසින් දේවාලයට නැගෙනහිර සීමාවට ආසන්නව වෙළදාම් සඳහා පෙරහැර ගමන් කිරීමට අවහිර නොවන පරිදි අවසර දෙමි.

(vi) ඉහත (iv, v) වලින් නියම කර ඇති පරිදි හැර කඳවුරු භූමිය ඇතුළත අන් කිසිම ස්ථානයක වෙළදාම් කිරීම සම්පූර්ණයෙන් තහනම් කරයි.

(vii) ප්‍රධාන මාර්ගයේ පුද්ගලික වාහන නතර කිරීම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියලුම රථ වාහන මාර්ග හෝ කඳවුරු භාර නිලධාරි තැනගේ බලපත්‍රයක් නොමැතිව කඳවුරු භූමිය තුළට ඇතුළත් කිරීම තහනම් ය.

(viii) මා විසින් කඳවුරු භූමිය තුළ වෙළදාම් කිරීම සඳහා වෙන් කරනු ලබන බිම් කොටස් බදු දෙන ආකාරය දැන්වීම් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

(ix) බද්දට ගන්නා ලද වෙළඳ බිම්වල ඉදිකරනු ලබන තාවකාලික ගොඩනැගිලි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස් වලට අනුකූල විය යුතු ය. බිම් කොටස් බදු ගන්නා වෙළෙන්දන් විසින් ඇසල උත්සවයෙන් පසු තම තමන්ගේ තාවකාලික ගොඩනැගිලි ඉවත්කර ගැනීමෙන් පසු කඳවුරු භූමිය තුළ පොලිතින් ඇතුළු සියලු අපද්‍රව්‍ය එකතු කර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ගේ උපදෙස් පරිදි ඉවත් කළ යුතු ය.

(x) මාගෙන් ලබාගත් අවසරයක් නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිදු ගොඩනැගිල්ලක් ඉදිරිකිරීම තහනම්ය.

(xi) රතිඤ්ඤා වෙඩි ආදිය ප්‍රදේශය තුළ පත්තු කිරීම තහනම්ය.

(xii) ප්‍රාදේශීය ලේකම්ගේ බලයලත් නිලධාරීන්ගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් කඳවුරු ප්‍රදේශය තුළ ටිකට්පත් කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයක් සඳහා හෝ මුදල් එකතු කිරීම නොකළ යුතු ය.

ජේ. එල්. සී. කේ. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්.

ඉඹුල්පේ,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-575

---

### වන්දනා ගමන් ආඥාපනත

දකුණු පළාත්, මාතර දිස්ත්‍රික්කයේ, පස්ගොඩ රොටුඹ පෙත්මග පුරාණ රජමහා විහාරයේ 2012 වාර්ෂික ආගමික උත්සවය 2012 අගෝස්තු මස 31 වැනි සිකුරාදා දින සිට 2012 සැප්තැම්බර් මස 09 වැනි ඉරිදා දින දක්වා පවත්වනු ලබන බව වන්දනා ගමන් ආඥාපනතේ 175 අධිකාරිය වූ වන්දනා ගමන් ආඥාපනතේ 02 වැනි වගන්තිය අනුව 2009.09.18 වැනි දින නිකුත් කරන ලද අංක 1620 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* යටතේ මෙයින් දන්වමි.

කේ. එන්. කෞශල්‍යා කුමාරි,
ප්‍රාදේශීය ලේකම්,
පස්ගොඩ.

2012 අගෝස්තු මස 08 වැනි දින,
පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-748

---

### වන්දනා නිවාඩු පනත

මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනේ දකුණු බස්නාහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොක්කට්ටිචෝලෙයි ශ්‍රී කාන්තෝන්රීස්වරර් දේවස්ථානයේ වාර්ෂික උත්සවය - 2012

ඉහත සඳහන් දේවස්ථානයේ 2012 වර්ෂයේ අගෝස්තු 20 වැනි දින පටන්ගෙන 2012 වර්ෂයේ සැප්තැම්බර් මස 02 වැනි දින රථ උත්සවය හා 2012 වර්ෂයේ සැප්තැම්බර් මස 03 වැනි දින දිය කැපීමෙන් අවසන් වන බව වන්දනාකරුවන්ට හා තවත් මෙම උත්සවය සමග සම්බන්ධව කටයුතු කරන අයටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

1948 වර්ෂයේ ජූලි මස 16 වැනි දින අංක 9886 දරන *රජයේ ගැසට් පත්‍රයේ* පළකර ඇති දැනට භාවිත සියලුම නීති රීති වන්දනාකරුවන්ට හා තවත් මෙම උත්සවයට සම්බන්ධව කටයුතු කරන අයටත් අවධානයට ගත යුතු බව ඉල්ලා සිටිනු ලැබේ.

සිවප්‍රියා විල්වරත්නම් මිය.,
ප්‍රාදේශීය ලේකම්.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
ම. ද. බ. පට්ටිප්පලෙය.

08-702

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මහජන බැංකුව - ගාල්ල මහවීදිය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.10.30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කපුගමගේ විසින් 2005.11.08 වැනි දින ලියා සහතික කරන ලද අංක 208 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්. නානායක්කාර ආගරගේ ධම්මික වසන්ත කුමාර, කහගල ගමගේ ගයා චාන්දනී යන අයවලුන් විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දෙලක්ෂ අටදහස් තුන්සිය තිස්තුනයි ශත තිහ (208,333.30) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2009.05.28 වැනි දින සිට වර්ෂයකට සියයට දහසයයි දශම හතයි පහ (16.75%) බැගින් රුපියල් දෙලක්ෂ අටදහස් තුන්සිය තිස්තුනයි ශත තිහ (208,333.30) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දෙලක්ෂ අටදහස් තුන්සිය තිස්තුනයි ශත තිහ (208,333.30) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 208 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පෙ පත්තුව, කොට්ටව ගමෙහි පිහිටි ගල්ගොඩ වැල්දෙනිය අද්දරදෙනිය නැමති ඉඩමට සර්වේ ජනරාල් වරයාගේ අවසාන ගම් පිඹුරු අංක 661 (TP 375016) පිඹුරේ නිරූපිත ඉඩම කේ. කන්නන්ගර මහතා විසින් මැන සාදන ලද අංක 107/1992 දරන 1992.09.20) දිනැති පිඹුර පරිදි අංක 831 දරන කැබැල්ලට මායිම්, උතුරට ලොට් අංක 832 ද, නැගෙනහිරට : ලොට් 835 ද, දකුණට : ලොට් 844 ද, බස්නාහිරට : ලොට් 844 ද යන සතර මායිම් තුළ පිහිටි අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් දාහතර (අක්. 1, රූ. 1, පර්. 14.0) ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

මෙම ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඩී 699/251 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22,
පහල ඩික්සන් පාර, ගාල්ල.

08-746

## ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සේපාලි වලතර විසින් ලියා සහතික කරන ලද අංක 1537 හා 2007 ඔක්තෝබර් මස 08 වැනි දින දරන ද්විතීයික උකස් බැඳුම්කරය මත සහ අංක 1705 හා 2010 ජූලි මස 23 වැනි දින දරන තෘතීයික උකස් බැඳුම්කරය යන උකස් බැඳුම්කර මත, අයවිය යුතු මුදල් ගෙවීම්, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර ඇත්තාවූ ද සහ ලියාපදිංචි අංක N ( PVS) 28764 දරන්නාවූ ද ලියාපදිංචි කාර්යාලය කැළණිය, දළුගම, පරණ නුවර පාර අංක 127/10 දරන ස්ථානයේ පිහිටා ඇත්තාවූ ද සමාගමක් වන (මෙහි මින් ඉදිරියට "එකී සමාගම" යනුවෙන් සඳහන් කරන) "බෙටන්ස් ගෲප් ඔෆ් කම්පනීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්" සමාගම විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2011 ජුනි 30 වැනි දිනට එකී "බෙටන්ස් ගෲප් ඔෆ් කම්පනීස් (ප්‍රයිවෙට්) ලිමටඩ්" සමාගමෙන් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට එකී අංක 1537 හා 1705 දරන උකස් බැඳුම්කර මත රුපියල් තුන් කෝටි හැත්තෑ එක් ලක්ෂ හැත්තෑහය දහස් හයසිය අසූඅටකුත් ශත අසූ නවයක (රු. 3,71,76,688.89) මුදලක් සහ 2011 ජූලි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් අසූ ලක්ෂ අනූපන් දහස් හත්සිය අසූනවයකුත් ශත නවයක් (රු. 80,95,789.09) සඳහා වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් පොලිය ද, රුපියල් එක්කෝටි හැත්තෑඑක් ලක්ෂ අනූනව දහස් නවසිය අසූනවයක් (රු. 1,71,99,989) සඳහා වර්ෂයකට සියයට දහහතකුත් දශම එකයි හය (17.16%) බැගින් පොලිය ද, රුපියල් හතලිස් හත් ලක්ෂ දහසය දහස් දෙසිය විසි එකකුත් ශත අනූ එකක් (රු. 47,16,221.91) සඳහා වර්ෂයකට සියයට විස්ස (20%) බැගින් පොලිය ද රුපියල් විසි දෙලක්ෂ තිස්අට දහසක් (රු. 22,38,000) සඳහා වර්ෂයකට සියයට විසිපහ (25%) බැගින් පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් තුන් කෝටි හැත්තෑ එක් ලක්ෂ හැත්තෑහය දහස් හයසිය අසූඅටකුත් ශත අසූ නවයක (රු. 3,71,76,688.89) මුදලක් සහ 2011 ජූලි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් අසූ ලක්ෂ අනූපන් දහස් හත්සිය අසූනවයකුත් ශත නවයක් (රු. 80,95,789.09) සඳහා වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් පොලිය ද, රුපියල් එක්කෝටි හැත්තෑඑක් ලක්ෂ අනූනව දහස් නවසිය අනූනවයක් (රු. 1,71,99,989) සඳහා වර්ෂයකට සියයට දහහතකුත් දශම එකයි හය (17,16%) බැගින් පොලිය ද, රුපියල් හතලිස් හත් ලක්ෂ දහසය දහස් දෙසිය විසි එකකුත් ශත අනූ එකක් (රු. 47,16,221.91) සඳහා වර්ෂයකට සියයට විස්ස (20%) බැගින් පොලිය ද, රුපියල් විසිදෙලක්ෂ තිස්අට දහසක් (රු. 22,38,000) සඳහා වර්ෂයකට සියයට විසිපහ (25%) බැගින් පොලිය ද හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට

අදාළ ඉඩම් හා පරිශ්‍ර සහ එහි පිහිටි වෙනත් සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී අංක 1537 හා 1705 දරන උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමඟ අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1537 හා 1705 දරන උකස් බැඳුම්කර මගින් බෙටන්ස් ගෲප් ඔෆ් කම්පනීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම් හා පරිශ්‍ර සහ එහි පිහිටි වෙනත් සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 1537 හා 1705 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, ඕපාත ග්‍රාමයේ පිහිටි "කරදගහදෙණිය (කොටසක්)" නමැති ඉඩමේ (සර්වේයර් ජනරාල් ඒ. බී. ෆ්‍රෙයර්ස් කැප්ටන් RE විසින් සකස් කළ අංක 86458 හා 1872 මැයි 31 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1937 ලෙස දැක්වෙන ඉඩම නැවත මැන අනුබෙදීමක් වන) බලයලත් මානක එච්. ලාල් ගුණසේකර මැන සකස් කළ අංක 9800 හා 2005 පෙබරවාරි 10 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 6 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : ඉහත කී අංක 9800 දරන පිඹුරේ ලොට් අංක 1 ද, නැගෙනහිරට : ඉහත කී අංක 9800 දරන පිඹුරේ ලොට් අංක 1, 4 (පාරක් සඳහා වෙන්කළ බිම), සහ ලොට් අංක 7 ද, දකුණට : ඉහත කී අංක 9800 දරන පිඹුරේ ලොට් අංක 7 සහ ජස්ටින් ජයවර්ධන හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට : එකී අංක 9800 දරන පිඹුරේ ලොට් අංක 1 සහ ජස්ටින් ජයවර්ධන හිමිකම් කියන ඉඩම ද, යන මායිම් ඇතුළත එකී අංක 9800 දරන පිඹුර ප්‍රකාර අක්කර දෙකක් (අ. 2, රූ. 0, පර්. 0) නොහොත් හෙක්ටෙයාර් 0.8096 ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ, මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

සහ

මෙහි පහත සවිස්තරව විස්තර කරන පාරක් සඳහා වෙන්කළ බිම තුළින් මතින් හෝ ඔස්සේ උකස්කරුට ඔහුගේ ආගන්තුකයන්ට ඉංජිනේරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට, ගෘහ නිර්මාණ ශිල්පීන්ට, කම්කරුවන්ට, සේවකයන්ට, කුලී නිවැසියන්ට, අවසරලාභීන්ට සහ ආරාධිතයින්ට මෙයින් පසු සැමවිටම සදාකාලයටම ඔවුන්ගේ අභිමතය හා කැමැත්ත පරිදි කවර වූ හෝ සියලු කාර්යය සඳහා පයින් හෝ අන්‍යාකාරයකින් යාම් ඊම් කිරීමට ද, අසුන් ගවයින් හෝ වෙනත් සතුන් සහිතව හෝ නොමැතිව ද මෝටර් රථ, ලොරි හෝ වෙනත් ඕනෑම වර්ගයක වාහනයකින්, බරපටවා හෝ නොපටවා දිවා හෝ රාත්‍රී කාලයේදී ප්‍රවේශවීම, පිටවීම හා ප්‍රත්‍යාගමනයට පූර්ණ බාධා විරහිත අයිතිවාසිකම, නිදහස හා අවසරය ද එයට අයත් හෝ ආබද්ධ සහ ඒ හා සමඟ භුක්ති විඳිනු ලබන දරනු ලබන හා සාමාන්‍යයෙන් ප්‍රයෝජනයට ගනු ලබන සියලු හා එක් එක් ඵලප්‍රයෝජන අයිතිවාසිකම් හා ලාභ ප්‍රයෝජන ද ඒ මත, එයතුළ, ඊට උඩින්, එය යටින් සහ/හෝ එය ඔස්සේ විදුලි රැහැන් සහ මුදුන් කම්බි ජලාපවහන, ගෑස්, ජලනල හා වෙනත් උවාරණ සහ කවර හෝ වර්ගයක හෝ ස්වභාවයක උපක්‍රම ආදිය යෙදීමට ද පූර්ණ බාධා විරහිත අයිතිවාසිකම හා නිදහස මීට ඇතුළත් වේ.

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, ඕපාත ග්‍රාමයේ පිහිටි "කරදගහදෙණිය (කොටසක්)" නමැති ඉඩමේ (සර්වේයර් ජනරාල් ඒ. බී. ෆ්‍රෙයර්ස් කැප්ටන් RE විසින් සකස් කළ අංක 86458 හා 1872 මැයි 31 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1937 ලෙස දැක්වෙන ඉඩම නැවත මැන අනුබෙදීමක් වන) (අඩි 15ක් පළල පාරක් සඳහා වෙන්කළ බලයලත් මානක එම්. ලාල් ගුණසේකර මැන සකස් කළ අංක 9800 හා 2005 පෙබරවාරි මස 10 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 3A ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කොටසට මායිම් උතුරට : ඉහත කී අංක 9800 දරන පිඹුරේ ලොට් අංක 2 සහ 1 හා බී. ඩී. ඩග්ලස්ගේ ඉඩම ද, නැගෙනහිරට : මහපාර සහ එකී අංක 9800 දරන පිඹුරේ ලොට් අංක 2 ද, දකුණට : එකී අංක 9800 දරන පිඹුරේ ලොට් අංක 5 සහ 8 හා ජී. යූ. එච්. සිල්වාගේ ඉඩම ද, බස්නාහිරට : එකී අංක 9800 දරන පිඹුරේ ලොට් අංක 8, 7 සහ (පාරක් සඳහා වෙන්කළ) ලොට් අංක 4 ද, යන මායිම් ඇතුළත එකී අංක 9800 දරන පිඹුර ප්‍රකාර රූඩ් එකයි පර්චස් දහතුනයි දශම අටක් (අ. 0, රූ. 1 පර්. 13.8) නොහොත් හෙක්ටෙයාර් බිංදුවයි දශම එකයි තුනයි හයයි එකක් (හෙ. 0.1361) බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ, මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, ඕපාත ග්‍රාමයේ පිහිටි "කරදගහදෙණිය (කොටසක්)" නමැති ඉඩමේ (සර්වේයර් ජනරාල් ඒ. බී. ෆ්‍රෙයර්ස් කැප්ටන් RE විසින් සකස් කළ අංක 86458 හා 1872 මැයි 31 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1937 ලෙස දැක්වෙන ඉඩම නැවත මැන අනුබෙදීමක් වන) (අඩි 20ක් පළල පාරක් සඳහා වෙන්කළ බලයලත් මානක එම්. ලාල් ගුණසේකර මැන සකස් කළ 9800 හා 2005 පෙබරවාරි මස 10 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 4 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කොටසට මායිම් උතුරට : ඉහත කී අංක 9800 දරන පිඹුරේ ලොට් අංක 1 ද, නැගෙනහිරට : එකී අංක 9800 දරන පිඹුරේ (පාරක් සඳහා වෙන්කළ) ලොට් අංක 3A ද, දකුණට : එකී අංක 9800 දරන පිඹුරේ ලොට් අංක 7 ද, බස්නාහිරට : එකී අංක 9800 දරන පිඹුරේ ලොට් 6 ද, යන මායිම් ඇතුළත එකී අංක 9800 දරන පිඹුර ප්‍රකාර පර්චස් දාහහතරයි දශම හතක් (අ. 0, රූ. 0, පර්. 14.7) නොහොත් හෙක්ටෙයාර් බිංදුවයි දශම බිංදුවයි දෙකයි හතයි තුනක් (හෙ. 0.0273) බිම් ප්‍රමාණයකින් යුත් බිම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ, මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

ලක්ෂ්මන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරී.

ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73,
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

08-712

---

**මහජන බැංකුව - අම්බලන්ගොඩ**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ

මණ්ඩලය විසින් 2011.07.27 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කපුගමගේ විසින් 2010.04.06 සහ 2010.06.29 වැනි දින වලදී ලියා සහතික කරන ලද අංක 4604 සහ 4605 සහ 4937 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, සුමල් කළුතර මහතා සහ ටී. ඒ. නයනා මාලනී මිය යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් විසිදෙලක්ෂ පනස්දහසයි ශත හතරක (රු. 22,50,000.04) මුදලක් සහ රුපියල් විසි එක් ලක්ෂයක (රු. 21,00,000) මුදලක් සහ රුපියල් දස ලක්ෂයක (රු. 10,00,000.00) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2010.10.16 වැනි දින සිට වර්ෂයකට සියයට පහලව (15%) බැගින් රුපියල් විසිදෙලක්ෂ පනස්දහසයි ශත හතර (රු. 22,50,000.04) ක මුදලක් සඳහා සහ 2010.09.01 වැනි දින සිට වර්ෂයකට සියයට විසි අට (28%) බැගින් රුපියල් විසිඑක් ලක්ෂයක (රු. 21,00,000) මුදලක් සඳහා සහ වර්ෂයකට සියයට විසි අට (28%) බැගින් රුපියල් දස ලක්ෂයක (රු. 10,00,000) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් විසි දෙලක්ෂ පනස්දහසයි ශත හතර (රු. 22,50,000.04) ක මුදලක් සහ රුපියල් විසිඑක් ලක්ෂයක (රු. 21,00,000) මුදලක් සහ රුපියල් දසලක්ෂයක (රු. 10,00,000) මුදලක් අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 4604 සහ 4605 සහ 4937 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ, වතුගෙදර පිහිටි මොහොට්ටිගෙදර වත්ත නොහොත් පොන්නානවත්ත සහ සුදුවේකුඹුර නොහොත් කලුවේ කුඹුර ඉඩම සඳහා බලයලත් මානක වී ගොඩහේන මහතාගේ අංක 517 දරන 1996.06.28 දිනැති පිඹුර ප්‍රකාර ලොට් ඒ දරන කැබැල්ලට මායිම්, උතුරට : දූවේවත්ත ඇල සහ ජුවනානගේ වත්ත සහ නැගෙනහිරට : ඇල සහ සුනිත් ගල්කුඹුර, දකුණට : දූවේවත්ත, වැකන්ද, හේමලතා විජේන්ද්‍ර, බස්නාහිරට : පාර සහ දූවෙවත්ත යන හතර මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් දොළහක් (අක්. 0, රූ. 1, පර්. 12) විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ඇතුළු සියලුම දේ ද වේ. මෙම ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක A215/251 හි ලේඛනගතව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහළ ඩික්සන් පාර,
ගාල්ල.

08-745

### ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2012 ජුනි මස 27 වැනි දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව නමට මාතර ප්‍රසිද්ධ නොතාරිස් පී. ජී. එල්. ප්‍රසන්න ගාල්ලගේ විසින් ලියා සහතික කරන ලද අංක 426 හා 2007 අප්‍රේල් මස 09 වැනි දින දරන උකස් බැඳුම්කරය මත, අයවිය යුතු මුදල් ගෙවීම, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාපනය කර ඇත්තාවූ ද N (PVS) 29357 දරන්නාවූ සහ (මෙහි මින් ඉදිරියට "එකී සමාගම" යනුවෙන් සඳහන් කරනු ලබන්නාවූ ද) ලියාපදිංචි කාර්යාලය මාතර, නූපේ, ධර්මපාල මාවත, අංක 310 දරන ස්ථානයේ පිහිටා ඇත්තාවූ ද සදර්න් ඇසෝෂියේට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් යන සමාගම විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2011 අගෝස්තු මස 31 වැනි දිනට එකී සදර්න් ඇසෝෂියේට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් තිස්හතර ලක්ෂ හය දහස් හයසිය හැත්තෑ දෙකකුත් ශත හතලිස් නවයක (රු. 34,06,672.49) මුදලක් සහ 2011 සැප්තැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් විසිදෙලක්ෂ හැත්තෑනව දහස් තුන්සිය හතලිස් පහකුත් ශත තිස්තුනක් (රු. 22,79,345.33) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රියෙල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ සති දොළහේ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) වර්ෂයකට සියයට එකොළහක් (11%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතික මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල රුපියල් තිස්හතර ලක්ෂ හය දහස් හයසිය හැත්තෑ දෙකකුත් ශත හතලිස් නවයක (රු. 34,06,672.49) මුදල සහ 2011 සැප්තැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් විසිදෙලක්ෂ හැත්තෑනව දහස් තුන්සිය හතලිස් පහකුත් ශත තිස්තුනක් (රු. 22,79,345.33) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රියෙල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ සති දොළහේ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට එකොළහක් (11%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී අංක 426 දරන උකස් බැදුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑස්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා සදර්න් ඇසෝෂියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින්

ඉහත කී අංක 426 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇත බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 426 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, උතුරු වැලිගම් කෝරළේ හොරගොඩ ග්‍රාමයේ පිහිටි කුමාරදාස එස්ටේට් හි කොටසක් නොහොත් ආදාදොළහේන නොහොත් වත්ත, කුමාරදාස එස්ටේට් හි කොටසක් නොහොත් ඉපලෝලුවේ වත්ත සහ ඉපලෝලුවේ වත්ත ලොට් 1A නමැති ඒකාබද්ධ කළ ඉඩමේ ලොට් අංක 2 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. යූ. අබේගුණවර්ධන මැන සකස් කළ අංක 2959 හා 2007 ජූලි මස 03 වැනි දින දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කළ බිම් කොටස වන ලොට් අංක 1 දරන බිම් කට්ටියට මායිම්, උතුරට : අංක 1439 දරන පිඹුරේ ලොට් අංක 1 සහ මෙම ඉඩමේ ලොට් අංක 2 ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් අංක 2 සහ ලොට් අංක 60 ද, දකුණට : මෙම ඉඩමේ ලොට් අංක 60 සහ 39 ද, බස්නාහිරට : අංක 1439 දරන පිඹුරේ ලොට් අංක 1 ද, යන මායිම් ඇතුළත ඉහත කී අංක 2959 දරන පිඹුර ප්‍රකාර පර්චස් දොළහකුත් දශම හයයි අටක් (අ. 0, රූ. 0, පර්. 12.68) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි වැවිලි සහ වෙනත් සියලු දේ.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, උතුරු වැලිගම් කෝරළේ හොරගොඩ ග්‍රාමයේ පිහිටි කුමාරදාස එස්ටේට් හි කොටසක් නොහොත් ආදාදොළහේන නොහොත් වත්ත, කුමාරදාස එස්ටේට් හි කොටසක් නොහොත් ඉපලෝලුවේ වත්ත සහ ඉපලෝලුවේ වත්ත ලොට් 1 A නමැති ඒකාබද්ධ කළ ඉඩමේ ලොට් අංක 2 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. යූ. අබේගුණවර්ධන මැන සකස් කළ අංක 2959 හා 2007 ජූලි මස 03 වැනි දින දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කළ බිම් කොටස වන ලොට් අංක 2 දරන බිම් කට්ටියට මායිම්, උතුරට : අංක 1439 දරන පිඹුරේ ලොට් අංක 1 සහ මෙම ඉඩමේ ලොට් අංක 3 ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් අංක 3 සහ ලොට් අංක 60 ද, දකුණට : මෙම ඉඩමේ ලොට් අංක 60 සහ ලොට් අංක 1 ද, බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් අංක 1 සහ අංක 1439 දරන පිඹුරේ ලොට් අංක 1 ද, යන මායිම් ඇතුළත ඉහත කී අංක 2959 දරන පිඹුර ප්‍රකාර පර්චස් දොළහකුත් දශම හයයි අටක් (අ. 0, රූ. 0, පර්. 12.68) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි වැවිලි සහ වෙනත් සියලු දේ.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, උතුරු වැලිගම් කෝරළේ හොරගොඩ ග්‍රාමයේ පිහිටි කුමාරදාස එස්ටේට් හි කොටසක් නොහොත් ආදාදොළහේන නොහොත් වත්ත, කුමාරදාස එස්ටේට් හි කොටසක් නොහොත් ඉපලෝලුවේ වත්ත සහ ඉපලෝලුවේ වත්ත ලොට් 1 A නමැති ඒකාබද්ධ කළ ඉඩමේ ලොට් අංක 2 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. යූ. අබේගුණවර්ධන මැන සකස් කළ අංක 2959 හා 2007 ජූලි මස 03 වැනි දින දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කළ බිම් කොටස වන ලොට් අංක 3 දරන බිම් කට්ටියට මායිම්, උතුරට : අංක 1439 දරන පිඹුරේ ලොට් අංක 1 සහ මෙම ඉඩමේ ලොට් අංක 4 ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් අංක 4 සහ ලොට් අංක 60 ද, දකුණට : මෙම ඉඩමේ ලොට් අංක 60 සහ ලොට් අංක 2 ද, බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් අංක 2 සහ අංක 1439 දරන පිඹුරේ ලොට් අංක 1 ද, යන මායිම් ඇතුළත ඉහත කී අංක 2959 දරන පිඹුර ප්‍රකාර පර්චස් දොළහකුත් දශම හයයි අටක් (අ. 0, රූ. 0, පර්. 12.68) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි වැවිලි සහ වෙනත් සියලු දේ.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, උතුරු වැලිගම් කෝරළේ හොරගොඩ ග්‍රාමයේ පිහිටි කුමාරදාස එස්ටේට් හි කොටසක් නොහොත් ආදාදොළහේන නොහොත් වත්ත, කුමාරදාස එස්ටේට් හි කොටසක් නොහොත් ඉපලෝලුවේ වත්ත සහ ඉපලෝලුවේ වත්ත ලොට් 1 A නමැති ඒකාබද්ධ කළ ඉඩමේ ලොට් අංක 2 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. යූ. අබේගුණවර්ධන මැන සකස් කළ අංක 2959 හා 2007 ජූලි මස 03 වැනි දින දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කළ බිම් කොටස වන ලොට් අංක 4 දරන බිම් කට්ටියට මායිම්, උතුරට : අංක 1439 දරන පිඹුරේ ලොට් අංක 1 සහ මෙම ඉඩමේ ලොට් අංක 5 ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් අංක 5 සහ ලොට් අංක 60 ද, දකුණට : මෙම ඉඩමේ ලොට් අංක 60 සහ ලොට් අංක 3 ද, බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් අංක 3 සහ අංක 1439 දරන පිඹුරේ ලොට් අංක 1 ද, යන මායිම් ඇතුළත ඉහත කී අංක 2959 දරන පිඹුර ප්‍රකාර පර්චස් දොළහකුත් දශම හයයි අටක් (අ. 0, රූ. 0, පර්. 12.68) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි වැවිලි සහ වෙනත් සියලු දේ.

